# විශේෂ නිවේදනය

## ජපානයේ රැකියා සිහිනය සැබෑකර ගැනීමට ඔබට අනගි අවස්ථාවක් !

ජපානයේ විශේෂ නිපුණතා සහිත රැකියා (SSW) සඳහා වන කුසලතා පරීක්ෂණ ජපන් රජයේ මෙහෙයවීමෙන් ශ්‍රී ලංකාවේදී පැවැත්වේ. එම කුසලතා පරීක්ෂණය ජපානය විසින් තෝරාගත් අංක 32C, ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් මාවත, ඩික්මන්ස් පාර, කොළඹ 05 ලිපිනයේ පිහිටා ඇති **Australian College of Business and Technology (ACBT Campus)** ආයතනයේදී 2026 වර්ෂයේ නොවැම්බර් මාසයේ 3, 23 සහ 24 යන දිනයන් හැර අනෙකුත් දිනයන්හිදී පැවැත්වීමට නියමිත බව http://ac.prometric-jp.com/testlist/ssw/index.html වෙබ් අඩවියෙහි සඳහන් කර ඇත.

- **මූලික භාෂා පරීක්ෂණය (JFT Basic)**
- **හෙද සත්කාරක සේවය (Nursing Care)**
- **ආහාර සේවා කර්මාන්තය (Food Service Industry)**
- **කෘෂිකර්මාන්තය (Agriculture)**
- **ඉදිකිරීම් ක්ෂේත්‍රය (Construction)**
- **නවාතැන් කර්මාන්තය (Accommodation Industry)**

**මෙම කුසලතා පරීක්ෂණය සඳහා අයදුම් කිරීමට බලාපොරොත්තු වන ඔබ ඒ සඳහා අයදුම් කිරීමට පෙර පහත සඳහන් උපදෙස් අනුගමනය කල යුතුය.**

1. අයදුම් කිරීමට පෙර ඔබ විද්‍යුත් තැපැල් ලිපිනයක් (Email address) සකස් කර ගත යුතු වේ.
2. කුසලතා පරීක්ෂණයට පෙනී සිටීම සඳහා ඔබ විසින් Prometric හැඳුනුම්පතක් සකස් කර ගැනීම අනිවාර්ය වන අතර, ඒ සඳහා http://ac.prometric-jp.com/testlist/ssw/index.html වෙබ් අඩවියට පිවිස එහි සඳහන් උපදෙස් පිළිපැදිය යුතුවේ.
3. විභාග ගාස්තු ගෙවිය හැක්කේ Visa Card වලින් පමණි. (විභාග ගාස්තු ගෙවීමේදී වෙනත් අයෙකුගේ Visa Card පතකින් වුවද ගෙවීම් සිදු කල හැක.)
4. ලියාපදිංචි වූ පසුව ඔබට අදාල විභාග මධ්‍යස්ථානය සහ එහි ලිපිනය ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනය වෙත ජපන් රජය විසින් යොමු කරනු ලබයි.

සැලකිය යුතුයි :-

ජපානයේ විශේෂ නිපුණතා සහිත රැකියා (SSW) වැඩසටහන හා කුසලතා පරීක්ෂණ පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිල වෙබ් පිටුව වන www.slbfe.lk වෙත පිවිසෙන්න.


**සභාපති - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**

**එතෙර සවියට මෙතෙර අත්වැල**

අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල

දුරකථන අංකය - 1989 Ex 433

විද්‍යුත් තැපැල - mgr_rec.general@slbfe.lk, වෙබ් අඩවිය - www.slbfe.lk